# 8 සහජීවනයෙන් වැඩ කරමු

කිසියම් සමාජයක ජීවත්වන්නන් අන්‍යෝන්‍ය උපකාරය, සහයෝගය ඇති ව, සාමයෙන් සමගියෙන් එකාවන් ව ක්‍රියා කිරීම සහජීවනය නම් වෙයි. එවන් සමාජයක මිනිස්සු සිය ආගමික කටයුතුවල දී ද වෘත්තීය කටයුතුවල දී ද පොදු කටයුතුවල දී ද මඟුල් අවමඟුල් ආදි සමාජ කටයුතුවල දී ද එක්වෙති; සමගියෙන් බැඳී කටයුතු කරති. දුකේ දී මෙන් ම සැපේ දී ද එකිනෙකාට උපකාරී වෙති. ආත්මාර්ථය පසුපස ම යන තම සුව පහසුව වාසිය ලාභය පමණක් ම පතන මිනිසුන් නො වන ඔවුහු, හැකි හැම විටක දී ම පරාර්ථකාමී වෙති. අන්‍යයන්ගේ යහපතට ද කැමැති වෙති. උස්මිටිකම් නො සලකති. බුදුදහම එබඳු සමාජයකට මග පෙන්වයි.

සිතුවිල්ලෙන් මෙන් ම ක්‍රියාවෙන් ද එකිනෙකාට යහපත සිදු කරන බෞද්ධයෝ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සිව් බඹ විහරණ ඇත්තෝ ය. "තමාට මෙන් ම තම නෑ හිතවතුන් ඇතුළු සතුරු මිතුරු සියලු සත්ත්වයින්ට සැපතක් ම වේ වා" යි ඔවුහු මෙත් වඩති. එසේ ම දුකට විපතට පත් වූ කවරකු පිළිබඳ ව වුව ද ඒ සත්පුරුෂයන් තුළ කරුණාව, අනුකම්පාව, හද කම්පනය උපදියි. අනුන් කෙරෙහි ඊර්ෂ්‍යා නො කරන අනුන්ගේ සැපතේ දී සතුටු වන මුදිතා ගුණය ද ඔවුන් තුළ ඇත. ජාති, කුල, ආගම් ආදී වෙනස්කම් හෝ උස්මිටි කම් නො සලකන ඔවුහු මැදිහත් සිත් ඇත්තෝ ය. මෙකී බඹ විහරණ තුළින් මිනිස්සු සහජීවනයට ම පෙළඹෙත්. එසේ ම බුදු දහම උගන්වන පරිදි සැබෑ බෞද්ධයෝ සිව් සඟරාවත් ක්‍රියාවට නගන්නෝ ය. පරාර්ථය සලසන ඔවුහු දානය, පරිත්‍යාගය කැමැත්තෝ ය. කාලය ද ශ්‍රමය ද ධනය ද අනුන්ට දීමට නිර්ලෝභී වන්නෝ ය. කනට මිහිරි වූ අනුන් සිත් පිනවන ප්‍රිය වචන භාවිත කරන්නෝ ය. අන් අයගේ දියුණුවට වැඩ කරන පරාර්ථ චර්යාව ඇත්තෝ ය. ජාති භේද, කුල භේද, ආගම් භේද, භාෂා භේද නො සලකා සමානාත්මතාවෙන් ක්‍රියාකරන්නෝ ය. මෙකී සතර සංග්‍රහ වස්තු තුළින් ද අප යොමු වන්නේ සහජීවනයට ය. ආත්මාර්ථය එනම්, තම යහපත මෙන් ම, පරාර්ථය එනම්, අන් අයගේ යහපත ද යන උභයාර්ථය ම එකසේ අපේක්ෂා කරන්නකු බිහි කිරීම බුදුදහමෙහි අරමුණ වූ බව මින් පෙනේ. එබඳු මිනිස්සු එකිනෙකාට උපකාරී වෙති. දුක සැප දෙකේ දී ම සහජීවනයෙන් වැඩ කරති.

එමගින් සමාජ ජීවිතයේ සතුට, සාමය මෙන් ම දියුණුව ද සලසා ගත හැකි ය.

බෞද්ධ සමාජයක ගිහියන් විසින් නිති සුරැකිය යුතු පිළිවෙත නම් පඤ්ච ශීලයයි. එමගින් මානව සදාචාරය මෙන් ම සහජීවනය ද තහවුරු වෙයි. එහි පරපණ නැසීමෙන් වැළකීම, සියලු ප්‍රාණීන්ට කාරුණික වීම පළමු ව ඉගැන්වේ. ජාතිය, ආගම, භාෂාව, කුලය, ශරීර වර්ණය කුමක් වුව ද මිනිසකු වුව ද, තිරිසන් සතකු වුව ද, ලොකු කුඩා කවර ප්‍රාණියකු වුව ද වැනසීම, හිංසා කිරීම වරදකැයි පිළිගන්නා අපි එකිනෙකාගේ ජීවිතය සුරකිමු; එකිනෙකාට කරුණාව මෛත්‍රිය ඇති ව වසමු. මෙය සහජීවනයට මග සලසයි. නුදුන් දේ ගැනීමෙන් සොරකමින් වළකින අපි අන් අයගේ දේපළ සම්පත් සුරකිමු; එම අයිතියට ගරු කරමු. කාම මිථ්‍යාචාරයෙන් හෙවත් අසම්මත අඹු-සැමි සබඳතා පැවැත්වීමෙන් හා මත් වතුර, මත් ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී ශිෂ්ට සම්පන්න ව, හොඳ සිහියෙන්, සාමකාමී ව සුහද ව ජීවත්වීමේ පිළිවෙතින් ද සහජීවනය තහවුරු වෙයි. මේ පිළිවෙත් සුරැකීමේ දී ද සමාජය තුළ ඇති විවිධ වෙනස්කම් සැලකිල්ලට නො ගැනෙයි.

බෞද්ධ සමාජයක සහජීවනය පිළිබඳ පරමාදර්ශය වන්නේ බුදුරදුන් ප්‍රධාන සඟරුවනයි. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි පැරණි භාරතීය සමාජ පරිසරය නොයෙකුත් ආගමික දාර්ශනික මතවාද දරන්නන්ගෙන් පිරී පැවතිණ. එසේ ම ඔවුහු වාද විවාද කරමින් ගැටුණෝ ය. එහෙත් බුදුරදුන් අනුගමනය කළේ මැදුම් පිළිවෙතයි. එය අන්තර් ආගමික සහජීවනය උදෙසා ඉවහල් වන්නකි. විවිධ ආගම් අදහන ජන කොටස් සිටින දේශයක අප ද අනුගමනය කළ යුත්තේ එම පිළිවෙත ය. විරුද්ධ මතවාද ඉවසීම, ඒවා පිළිගත් අය සමඟ නො ගැටීම බුදුරජාණන් වහන්සේගේ ආදර්ශය වේ. උන්වහන්සේ නොයෙක් විට වෙනත් ආගමික අදහස් දේශනා කළ මහණ බමුණන්ගේ ආරාමවලට ද වැඩම කළහ. ඔවුහු බුදුරදුන් ඉතා ගෞරවයෙන් හා සතුටින් පිළිගත්හ. වෙනත් ආගමික අදහස් දරන්නන් තමන් වහන්සේ වෙත පැමිණි විට ද සුහද ව පිළිගැනීම, ඔවුන් හා සතුටු සාමීචියේ යෙදීම බුදුරදුන්ගේ පිළිවෙත වූයේ ය. එයින් ඔවුහු ඉමහත් සේ පැහැදුණෝ ය. සිය ශ්‍රාවකයන් ද එකිනෙකා කෙරේ මෙත් සිත් ඇති ව සිවු පසය පවා බෙදා හදා ගනිමින් වාසය කරනු දැක්ම බුදුරදුන්ගේ අපේක්ෂාව විය.

සමගියෙන් හා සතුටු සිතින් කිරි හා දිය මෙන් පෑහී, එකිනෙකා දෙස ප්‍රිය ඇසින් බලමින් ජීවත් වන ලෙස භික්ෂූන්ට උන්වහන්සේ අවවාද කළ අවස්ථා

රැසකි. භික්ෂූන් වහන්සේට අනුදැන වදාළ දේපළ අයිතිය හා පරිහරණය පිළිබඳ ආදර්ශවත් පිළිවෙත සාංඝික ක්‍රමයයි. පෞද්ගලිකත්වයට එහි තැනක් නැත. දන් පැන් වැළඳිය යුත්තේ ද ආවාස පරිහරණය කළ යුත්තේ ද කෙත්වතු ආදිය ප්‍රයෝජනයට ගත යුත්තේ ද සම අයිතියත් සහජීවනයත් ගරු කරමිනැයි එයින් උගන්වන ලදී.

මෙසේ බෞද්ධ සහජීවනය බුදුහාමුදුරුවන්ගේ අවවාදය හා ආදර්ශ ද ශ්‍රාවක භික්ෂූන් වහන්සේගේ මග පෙන්වීම ද තුළින් හැඩගැසුණකි. ලාංකික සමාජය තුළ ද මහින්දාගමනයේ පටන් අද දක්වා ම සහජීවන පිළිවෙත තහවුරු වී තිබේ. සැපත මෙන් ම විපත ද බෙදා හදා ගැනීමට බෞද්ධයෝ හුරු පුරුදු වී සිටිති.

## ආගමික කටයුතු

අපි බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි සාමූහික ව පින් දහම් කරමු; පින බෙදා හදා ගනිමු. අප හා එක් වීමට නො හැකි මියගිය ඥාති හිතවතුන්ට පවා සතුටින් පින් දෙමු. අපගේ නිවෙස්වල සිදුවන දානමානාදී පින්කම්වල දී පළමු ව මහ සඟරුවනට ගෞරවයෙන් පූජා පවත්වමු. ඒ සඳහා දන් පැන් පිළියෙල කරද්දී මෙන් ම පිළියෙල කළ දන්පැන් පිරිනැමීමේ දී ද අපි සාමූහික ව ක්‍රියා කරමු; කළ යුතු සියල්ල සාමූහික ව කරමු. නිවස පින්කම සඳහා සකස් කිරීම, සඟරුවන වැඩමවීම හා පිළිගැනීම, පන්සිල් සමාදන් වීම, දන් පැන් පිළිගැන්වීම, පින් අනුමෝදන් වීම ආදී කටයුතු මෙන් ම පින්කමින් පසු නිවස හා අවට පිරිසිදු කිරීම ද සහජීවනයෙන් යුතු ව ම සිදු කරමු. හැදෙන වැඩෙන දරුවන් ද මේ සඳහා සහභාගි කර ගනිමු. ගමේ පන්සලේ, පාසලේ හෝ ප්‍රජා ශාලාවේ සිදුවන පින්කම්වල දී ද එලෙසින් ම සාමූහික ව සතුටින් වැඩ කරමු. "මේ පින්කම අසුවලාගේ යැයි නො සිතා," "මේ පින්කම අප සැමගේ යැයි" සිතා එහි දී වැඩ කරන්නෙමු.

අපගේ වෙහෙර විහාරවල සිදුවන දානමාන පුද පූජාදී පින්කම්වල දී ද ඇතැම් විට ස්තූප, බෝ මළු, පෙති පිළිමාදිය ඉදිකිරීමේ දී ද එදා මෙන් ම අද ද අපේ වැඩිහිටියෝත් දූදරුවෝත් සහජීවනයෙන් වැඩ කරති. තෙරුවනට වෙන්කළ පුද පිරිකර අතිනත යවමින්, එක් හඬින් සාධු නාද දෙමින්, තෙරුවන් ගුණ ගයමින් අපි පින්කම් සිදු කරන්නෙමු. ඒ අපේ මුතුන් මිත්තන්ගේ ආදර්ශයයි. ඔවුහු සහජීවනයෙන් කටයුතු කරමින් ලොව මවිත කළ සුවිසල් මහ දාගැබ්

සහිත වූ අසිරිමත් වෙහෙර විහාර ඉදිකළහ; කාලය ද ශ්‍රමය ද ධනය ද එකමුතු ව වැය කළහ; එමඟින් නිවන් මඟ පාදා ගත්හ; සැදැහැ ගුණ වඩවා ගනිමින් පිනෙන් සරුවූ පවින් දුරු වූ දැහැමි සමාජයක් ගොඩනඟා ගත්හ. ඒ සහජීවනයෙන් උදාකරගත් ධාර්මික දියුණුවයි. පැරණි ධර්ම ශාලාවල සිව් දිශාවට දොරටු සතරකි. ඒ සිව් දෙසින් එන සැමට එක් ව දන්පින් කිරීමට ය. බෞද්ධයන් එදා මෙන් ම අද ද සහජීවනයෙන් ක්‍රියාකරන්නේ බුදු දහම පිළිගත්තවුන් සමඟ පමණක් නො වේ. බුදුරදුන්ගේ අවවාදය හා ආදර්ශය අනුව යමින් අන්‍යාගමිකයන් සමඟ ද අන්‍ය ජාතිකයන් සමඟ ද සහජීවනයෙන් ක්‍රියා කිරීම ශ්‍රී ලාංකිකයන්ගේ සුවිශේෂත්වයයි.




8.1 රූපය

## ගොවිතැන් කටයුතු

ශ්‍රී ලංකාව තවමත් ඉතා පුළුල් ලෙස කෘෂිකාර්මික කටයුතු කරන සුවිශාල ජනගහනයක් ඇති රටකි. යලමහ දෙකන්නයට ම ප්‍රමාණාත්මක ව ලැබෙන මහ වැසි මෙන් ම සරු සාර පොළවක් ද අප සතු ව ඇත. එදා මෙන් ම අදත් ශ්‍රී ලාංකික ගොවියන් සිය කටයුතු කරන්නේ එකමුතුකමිනි. "අත්තම" යනු වී ගොවිතැන්, හේන් ගොවිතැන් කළ අපේ පැරැන්නන්ගේ වචනයකි. ගොවි කටයුතුවල දී තමනට උපකාර කළ අනෙක් ගොවියනට උපකාර කිරීම් වශයෙන් වැඩ කර දීම එහි අදහසයි. "කයිය" තවත් එවන් වහරකි.

පිරිසක් වශයෙන් එක් ව වැඩ කිරීම ඉන් අදහස් වෙයි. "පංගුව" "පේරුව" වැනි වචන ද මෙහි දී සැලකිය යුතුයි. එක් එක් ගොවියාට හිමි වැඩ කොටස හෝ වැඩ කළ යුතු බිම් ප්‍රදේශය ඉන් අදහස් වෙයි. ගොවියෝ මෙබඳු ගොවි සිරිත් අනුව සහජීවනයෙන් වැඩ කරති. කුඹුරු, හේන් ආදියෙහි බිම් පිළියෙල කිරීම, බීජ රෝපණය කිරීම, වල් පැළ ඉවත් කිරීම, රැක බලා ගැනීම, අස්වනු නෙළීම, ඒවා සකසා ගැනීම ආදී වඩාත් වෙහෙසකර කටයුතුවල දී සහජීවන පිළිවෙත මැනවින් කැපී පෙනෙයි.

අපේ අතීත මුතුන් මිත්තෝ දුටුවන් මවිත කරවන මහ සයුර වන් යෝධ වැව් ඇතුළු සුවිසල් වාරිකර්මාන්ත කළෝ ය. ඒ එකමුතුවෙනි, සහජීවනයෙනි. එදා රජරට හැඳින්වූයේ වැව් බැඳි රට ලෙස ය. අක්කර සිය ගණන් සුවිශාල වූ වැව් මෙන් ම ගමින් ගම කුඩා වැව් ද ඔවුහු එකමුතු වී තැනුවෝ ය. මහත් කැප වීමෙන් ඩහදිය වගුරවමින් එකාවන් ව වෙහෙස වී සැතපුම් සිය ගණන් දිග ඇල මාර්ග ද ශක්තිමත් වේලි ද ඔවුහු ඉදි කළෝ ය. මහ පොළව සිප ගත් සරුසාර කෙත් යාය බිහි කළෝ ය. රට බතින් බුලතින් සරු වූ බැවින් පෙරදිග ධාන්‍යාගාරය වූයේ ය. එදා පැවති ආගමික සහජීවනය මෙරට ධර්මද්වීපයක් කිරීමට සමත් විය.



8.2 රූපය

ආර්ථික වශයෙන් මෙන් ම ධාර්මිකත්වයෙන් ද සරුසාර වූ මෙරට වැවත් දාගැබත් අප සතු සංස්කෘතියේ සංකේත බඳු විය. ඒ දෙක ම සහජීවන පිළිවෙත තුළින් ම උපන් බව පිළිගත් කරුණකි.

## සමාජ කටයුතු

දුක සැප දෙකෙහි දී ම එක්වීම උතුම් මිනිස් ගතියකි. සැබෑ හිතවතා තුළ එම මිනිස් ගුණය ඇතැයි බුදුරජාණන් වහන්සේ වදාළහ. ලක්වැස්සෝ ද තමන්ට අර්ථයෙන් ධර්මයෙන් මග පෙන් වූ භික්ෂූන් වහන්සේලාට සුවිශේෂ වූ දුක්බදායක සිදුවීම්වල දී මෙන් ම සුවදායක අවස්ථාවල දී ද සහජීවනයෙන් බැඳී කළ යුතු කුදු මහත් දේ කළහ. සිය ඥාති හිතවතුන්ට අදාළ වූ දුක්බදායක සිදුවීම්වල දී මෙන් ම සුවදායක අවස්ථාවල ද එලෙසින් ම කටයුතු කළෝ ය. ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේ ගිලන් වූ විට සිව්දෙසින් එක්වන ගැමියෝ කාලය ද ශ්‍රමය ද ධනය ද වැය කරමින් කළ යුතු දේ කරති. ඒ කිසිත් අපේක්ෂාවක් ඇති ව නො වේ. එමෙන් ම භික්ෂූන් වහන්සේ නමක් අපවත් වූ විට ගැමියන් ඉමහත් සංවේගයෙන්, ඉමහත් ගෞරවයෙන් එක්ව දහසකුත් එකක් කළ යුතු දේ කරමින්

ආදාහන කටයුතු සඳහා වෙහෙසෙන හැටි අපි දැක ඇත්තෙමු. විහාරස්ථානයක වැඩ වසන ස්වාමීන් වහන්සේ ශාසනික පදවියකට පත් වීම, සාමණේර හිමිනමක් උපසම්පදා ශීලයෙහි පිහිටුවීම වැනි අවස්ථාවල ද අපේ ගැමියන්ගේ සහජීවනයත් කැපවීමත් හොඳින් දැක ගත හැකි ය.

සිය ගිහි ඥාති හිතවතුන්ට අදාළ දුක්ඛදායක අවස්ථාවල දී මෙන් ම සුවදායක අවස්ථාවල ද ගැමියෝ  මෙලෙසින් ම එක්වෙති; එවැන්නකු ගිලන් වූ විට කළ යුත්ත කරති. මියගිය විට ද දිවා රැය වෙහෙස වී දුක බෙදා ගනිමින් සියලු කටයුතු ඉටු කරති. ඒ තනි තනි ව නො වේ, සහජීවනයෙනි. අසල්වැසි ඥාතියකුට අදාළ මංගල සම්මත ආවාහ විවාහ කටයුත්තක දී ද ඒ සතුට බෙදා ගනිමින් ඇප කැප වී එකමුතු ව වැඩ කිරීම අපේ පොදු ජනයාගේ සිරිතයි. වාදභේද පසෙක ලා යුතුකම් ඉටුකිරීමට ගැමියන් එක් වන්නේ සහජීවනය පිළිබිඹු කරමිනි. එසේ ම ගමට ම අදාළ පොදු විපතක් පැමිණි තැන එනම් ගංවතුරක්, නියඟයක් හෝ සුළි සුළඟක් වැනි පොදු විපතක් වූ තැන ද ගමට ම අදාළ වූ පොදු සැපතක් එළඹි තැන ද එනම් නව අවුරුදු උදාව වැනි අවස්ථාවල දී ද ගැමියෝ එක්වෙති. ඒ දුක් පීඩා මෙන් ම සතුට ද සම සම ව බෙදා ගනිමිනි. ගමේ පොදු කටයුතුවල දී ද මෙලෙස ම සහජීවනයෙන් වැඩ කිරීම ඉතා වැදගත් උතුම් ගුණයක් ලෙස සලකනු ලැබේ. මං මාවත් සැකසීම ඒදඬු පාලම් දැමීම, සුසාන භූමි සැකසීම ආදී කටයුතු සියල්ලන්ගේ ම යහපතට හේතුවන සමාජ සේවාවෝ ය.

එබඳු වැඩ කටයුතු බොහෝ විට සිදු කෙරෙනුයේ සහජීවනයෙනි. එහි දී නොමසුරු ව ශ්‍රමය දානය කිරීම ලක්වැසි බෞද්ධයන්ගේ සිරිතයි.



8.3 රූපය

භික්ෂූන් වහන්සේලාගේ ද ගම් ප්‍රධානීන්ගේ ද නායකත්වය යටතේ විහාරස්ථානයට හෝ ගමේ වෙනත් පොදු ස්ථානයකට රැස් ව සාකච්ඡා කොට ඒ ඒ වගකීම් බෙදා හදා ගනිමින් මනා කළමනාකරණයක් ද ඇති ව එබඳු කාර්යන්හි දී එක් ව වැඩ කරනු ලැබේ. එම ආදර්ශවත් ජනහිතකාමී නායකත්වයට සියල්ලෝ අවනත වෙති.

මෙසේ විවිධ අවස්ථාවල දී විවිධාකාරයෙන් සහජීවන පිළිවෙතෙහි පිහිටා සමගියෙන් වැඩ කිරීමට ශ්‍රී ලාංකිකයන් උගත්තේ බුදු දහම ඇසුරිනි. මහ සඟරුවනේ ආදර්ශයෙනි, අවවාදයෙනි. එය මහින්දාගමනයෙන් පසු ව උපන් අපේ සංස්කෘතියේ විශිෂ්ට ලක්ෂණයක් ලෙස සැලකිය යුතු ය. හැදෙන වැඩෙන බොදු දරුවන් ලෙස අපි එසේ සහජීවනයෙන් වැඩ කරමු.

**සාරාංශය**

මහින්දාගමනයෙන් පසු බුදු දහම ඇසුරින් මෙරට පොදු ජනයා අතර සහජීවන පිළිවෙත වෙසෙසින් ම තහවුරු විය. ජාති, ආගම්, කුල, පන්ති, භාෂා ආදී කවර වෙනස්කමකුදු නැති ව එක්සත් ව ඔවුහු වැඩ කරති. එම සහජීවනය ආගමික කටයුතු, කෘෂිකාර්මික කටයුතු, සමාජ කටයුතු ආදී විවිධ පැතිවලින් අපට දැක ගත හැකි ය. ඒ අනුව ක්‍රියා කිරීම සාමය ද සමඟිය ද දියුණුව ද උදාකරයි.

**ක්‍රියාකාරකම**

1. සහජීවනය යන්නෙහි අදහස කුමක්ද?
2. බුදුරදුන්, අන්‍යාගමිකයන් හා සහජීවනයෙන් ක්‍රියා කළ අවස්ථා දෙකක් ලියා දක්වන්න.
3. සහජීවනය තුළින් ලද හැකි සතුට හා දියුණුව කියැවෙන කවියක් හෝ ගීතයක් නිර්මාණය කරන්න.
4. අන්‍ය ආගමිකයන් සහ අන්‍ය ජාතිකයන් සමග සුහද ව ජීවත්වීමට ඔබට අනුගමනය කළ හැකි පිළිවෙත් මොනවා?

**පැවරුම**

ඔබේ නිවසේ සිදුවන දානමය පිංකමක දී ඊට සූදානම් වන අවස්ථාව, එය පිරිනමන අවස්ථාව, පිරිනැමීමෙන් පසු අවස්ථාව තුළ ඒ ඒ කටයුතු බෙදා හදාගෙන ක්‍රියාත්මක කිරීමට සුදුසු සැලැස්මක් සකස් කරන්න.